# ආරාමික කළමනාකරණය උදෙසා භික්ෂූන් අපේක්ෂා කළ ගිහි දායකත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (මිහින්තලා පුවරු ලිපිය ඇසුරින්)

පි. එන්. එම්. සමරතුංග[1], එන්. එස්. යු. නැලිගම[2]

## හැඳින්වීම

බු.ව. 236 දී ලක්දිව බුදුසසුන පිහිටුවීම තුළ ආගමික බෞද්ධ කටයුතු වර්ධනය වනවා මෙන් ම භික්ෂු - භික්ෂුණී සඞ්ඝයාගේ ගණන ද ක්‍රමයෙන් දියුණු වී ගියේ ය. එහෙත් ක්‍රි.ව. 6 වන විට ලෝකායත පක්ෂයට බර වූ ද ධනවත් වූ ද බලවත් වූ ද පිරිසක් බවට භික්ෂූන් වහන්සේ වෙනස් වන්නට විය. මේ හේතුවෙන් සම්බුද්ධශාසනයට පටහැනි ව දුශ්ශීල භික්ෂු ක්‍රියා වර්ධනය වන්නට විය. මෙම තත්ත්වයන් හමුවේ සම්බුද්ධශාසනයේ චිරස්ථිතිය හා නිර්මලත්වය උදෙසා රාජ්‍යය මැදිහත් වීම් තුළින් මෙන් ම විනයගරුක භික්ෂූන්ගේ මැදිහත් වීම තුළින් විවිධ වූ කතිකාවත් හා නීතිරීතීන් පනවන්නට විය. මේ අතර විහාර පාලනය පිළිබඳ ව නීති පැනවූ ශිලාලේඛනයක් ලෙස මිහින්තලා පුවරුලිපිය වැදගත් වෙයි. මෙහි සඳහන් නීතිමය රාමු විමර්ශනය කිරීමේ දී ආරාමික කළමනාකරණයට ගිහි පාර්ශ්වයේ දායකත්වය භික්ෂූන් විසින් අපේක්ෂා කළා ද යන්න අධ්‍යයනය කිරීම වැදගත් පැතිකඩකි.

## පර්යේෂණ අරමුණ

ආරාමික කළමනාකරණය පිළිබඳ ව මිහින්තලේ පුවරුලිපිය මූලාශ්‍රයාගතව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ යි.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය සිදු කිරීමේ දී දත්ත රැස් කිරීම, විශ්ලේෂණය හා ඉදිරිපත් කිරීම සඳහා සාහිත්‍ය මූලාශ්‍රය පරිශීලනය, ක්ෂේත්‍ර අධ්‍යයන, සම්මුඛ සාකච්ඡා ආදී පර්යේෂණ ක්‍රමවේද යොදා ගන්නා ලදී.

## පර්යේෂණ ගැටලුව

බුද්ධාගම ප්‍රචලිත වීමෙන් අනතුරු ව සඞ්ඝාරාම වර්ධනය වීම තුළ ඒවා කළමනාකරණයෙන් යුක්ත ව පවත්වා ගැනීම හා නඩත්තු කිරීම මෙන් ම ආරක්ෂණය භික්ෂූන්ට සිදු කළ නො හැකි වූ අතර, ආරාමික කළමනාකරණය සඳහා භික්ෂූන් විසින් ගිහි පාර්ශ්වයේ දායකත්වය අපේක්ෂා කළා ද? යන්න මෙහි පර්යේෂණ ගැටලුව යි.

## පර්යේෂණ සාකච්ඡාව/ප්‍රතිඵල

ආරාමික දේපල කළමනාකරණය කිරීමේ දී ඒවාට භික්ෂූන්ගෙන් වන මැදිහත් වීම් අවම කිරීමට පියවර ගෙන තිබීම මෙම ව්‍යවස්ථාවේ වැදගත් අංශයකි. මේ සඳහා **"නින්දගම්වල ස්ථිරව පදිංචි පුද්ගලයින්ට එම නින්දගම් භුක්ති විඳීමට හැකි වීමත් භික්ෂූන් සමඟ හවුලේ භුක්ති විඳීමට අවසරයක් නොමැත"** යනුවෙන් දක්වා ඇත. මේ අනුව බලන කළ භික්ෂූන්ට අන්‍යයන්ගේ ඉඩම් කෙරෙහි හිතවත්කම් හෝ

---

[1]. පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. niroshasamarathungas@gmail.com
[2]. පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. sajirauneligama@gmail.com

ඥාතිත්වය පදනම් කර ගනිමින් බලපෑම් කිරීමට හෝ ගිහියන් සමඟ එකට එක්ව ඉඩම් පාලනය කිරීමට තිබූ ඉඩකඩ අහෝසි කර ඇත. එසේ ම ව්‍යවස්ථාපිත කරුණු අනුව **"ඇත් වෙහෙරට අයත් කිසිඳු දේපලක් චේතියගිරි විහාරයේ භික්ෂූන් වහන්සේලාට පවරාගත නො හැකි අතර, තම නිලධාරීන් මඟින් ඇත්වෙහෙරට අයත් කිසිඳු ඉඩමකට බලපෑමක් නො කළ යුතු ය".** මෙයින් භික්ෂූන් වහන්සේලා විසින් තමාට අයත් පරිග්‍රහගත දේපල පාලනය කරනවාට විනා වෙනත් පරිශ්‍රසන්තක දේපල ද තමා යටතේ තබා ගනිමින් පාලන කටයුතු කළ ආකාරයක් හඳුනා ගත හැකි ය. මෙය මඟ හැරීම සඳහා ඉඩම් ගිහි පාලකයන්ට පවරා ඇති අතර, ඔවුන් ද අනවශ්‍ය ආකාරයෙන් නතු කරවාගෙන මෙම වෙහෙර සන්තක ඉඩම්වලට බලපෑම් නො කළ යුතු යි යන්න ව්‍යවස්ථා ගතකොට තිබේ. ව්‍යවස්ථා සැකසීමට පෙර විහාරසන්තක ඉඩම් භික්ෂූන් විසින් ඔවුන්ට රිසි ආකාරයෙන් පාලනය කළ අතර, එයට ගිහි දායකත්වයත් ඔවුන් අපේක්ෂා නො කළ බව මෙම වාරණ මඟින් පෙන්වා දීමට පුළුවන.

බදු හෝ විවිධ මාර්ගවලින් ලබා ගන්නා ආදායම් විනිවිදභාවයකින් යුක්තව භාවිත කිරීමට නිතීරිතී පැනවීම හරහා ඊට පෙර තම ඒකාධිපතිත්වය යටතේ භික්ෂූන් භාවිත කළ ආදායම් හා වියදම් නිලධාරීන් යෙදවීම හරහා යම් පාලනය වීමක් මෙහි දී හඳුනා ගත හැකි ය. **"සියලුම ප්‍රධාන නිලධාරීන් අභයගිරි හා චේතියගිරි භික්ෂූන් වහන්සේලා සමඟ රැස් වී ආදායම හා වියදම පිළිබඳ සාකච්ඡා පවත්වා තීරණ ගත යුතු ය"** ඇතැම් කාර්යයන්වල දී නිලධාරීන්ගේ අධීක්ෂණය හා නිරීක්ෂණය මත එය සිදු වූ බවට ද පෙනේ. **ධාතු ගෘහයට අයත් කරඬු අගුල් දමා නිලධාරීන් ඉදිරියේ මුද්‍රා කොට නියමිත ස්ථානයන්හි තැම්පත් කළ යුතු ය.** අදාළ රාජකාරිය සඳහා නිලධාරියා නොමැති අවස්ථාවල වැඩ බැලීම සඳහා වෙනත් නිලධාරියෙකු පත් කළ යුතු බව ව්‍යවස්ථාවේ දක්වා ඇත. **"ගෙවීම් අංශයේ සහල් එකතු කිරීමේ අංශයේ ද මධ්‍යාහ්නයට පෙර දන් බාර ගැනීම සිදු කරන ස්ථානයේ ද නිලධාරියෙක් රාජකාරී කටයුත්තක් සඳහා පිටතට යන්නේ නම් ඒ වෙනුවට වැඩ බැලීම සඳහා වෙනත් සේවකයෙකු පත් කළ යුතු ය"** එසේ ම නිලධාරීන්ගේ යැපීම් දීමනා හැර අනෙකුත් සියලු ආදායම්, දිනපතා නඩත්තු වියදම්, අයබදු එකතු කරන්නන්ට යන වියදම්, අනෙකුත් සියලු වියදම් ද ලේඛනයේ තැම්පත් කළ යුතු ය යනුවෙන් සඳහන් වීම තුළින් මුදල් සම්බන්ධ කටයුතුවල දී භික්ෂූන් වහන්සේලා හා නිලධාරීන් අතින් තම සීමාව ඉක්මවා කටයුතු කිරීම වළක්වාලීමට ද කටයුතු කර තිබෙන ආකාරය හඳුනා ගත හැකි ය.

පරිපාලන කටයුතු සංවිධාන කාර්යය සඳහා ගිහි පාර්ශ්වයේ මැදිහත් වීමෙන් සිදු වූ නමුදු විහාරස්ථ ආරාමාධිපති තනතුර ස්වාමීන් වහන්සේලාගේ මූලිකත්වයෙන් හොබවා තිබේ. ආරාම කළමනාකරණය තුළ භික්ෂූන්ට ලැබුන පාලක තනතුර එය විය. පාලන කාර්යයන් සියල්ල ගිහි පාර්ශ්වය වෙත පවරා ඔවුන් හොබවා තිබෙන ආකාරය හඳුනා ගත හැකි ය. ඒ අනුව වැඩ **කළමනාකරු, පරිපාලන කටයුතු භාර නිලධාරීන්, කාර්යය සැලසුම් භාර නිලධාරී, මුදල් අයකැමි සහකරු, විහාර දේපල භාරකරු, ධාන්‍ය ගබඩා පාලක, කම්කරු පාලක, ස්ථානභාර නිලධාරී** ආදී කාර්යයන් රාශියක් ගිහි පාර්ශ්වය මෙහෙයවා ඇත. නිලධාරීන් යොමු කිරීම භික්ෂූන් විසින් අපේක්ෂා කළා වූ තත්ත්වයක් නො වූ ද රාජ්‍ය මැදිහත් වීම මත භික්ෂූන් වෙත ඒකරාශී වී තිබූ කාර්යයන් මෙලෙස විමධ්‍යගත කොට භික්ෂූන් ස්වාධීන මට්ටමට පත් කිරීමට කටයුතු යොදා ඇත.

ආරාම කළමනාකරණ කාර්යයන් ගිහි පාර්ශ්වය වෙත පැවරු නමුදු ඔවුනට ද ස්වකීය අභිලාෂයන්ට අනුව එය කිරීමට අවස්ථාව නො ලැබුන අතර, සේවක මණ්ඩලය වෙත ද වාරණ පනවා තිබේ. එනම්, මෙහි සඳහන් වන පරිදි විහාර සේවකයන්ට නියෝග නිකුත් කිරීමට හා ඔවුන් සේවයෙන් පහ කිරීමට ව්‍යවස්ථා මණ්ඩල සමාජික භික්ෂූන් වහන්සේලාට බලය ලබා දී තිබීම පෙන්වීමට පුළුවන. විහාරයට අයත් දේපල පරිහරණය කිරීමේ දී අදාළ නිලධාරීන් "**තමන් අතින් සිදු විය හැකි අලාභ හානි සඳහා ආරක්ෂිත තැන්පතුවක් තැබීම අවශ්‍යය**" යනුවෙන් දක්වා තිබීම හරහා නිලධාරීන් වගකීම් සහගතව ස්වකීය රාජකාරියට අනුගත කිරීමක් හඳුනා ගත හැකි ය. නිලධාරීන් පත් කිරීමේ දී භික්ෂූන් වහන්සේලාගෙන් යම් බලපෑමක් සිදු විය හැකි බැවින් එයත් නියාමනය කිරීමට වග බලා ඇති බව පෙනේ. **විහාරස්ථානයේ භික්ෂුවකට කිසියම් සම්බන්ධයක් ඇති තැනැත්තෙකු සේවකයෙකු වශයෙන් පත් කර ඇත්නම් ඔහුට ගෙවූ වැටුප නැවත අයකරගෙන සේවයෙන් පහ කළ යුතු ය.** මීට අමතරව "**කිසිම නිලධාරියකු විහාරයේ සේවකයින් තම පෞද්ගලික කාර්යයන් සඳහා යොදා නො ගත යුතු ය. වසර අවසානයේ ශේෂපත්‍රයක් පිළියෙල කොට එය සඞ්ඝයා මධ්‍යයේ කියවිය යුතු ය. මෙම ව්‍යවස්ථාව කඩ කරන නිලධාරීන් වෙතොත් ඔවුන්ගෙන් දඩ මුදල් අය කරගෙන සේවයෙන් පහ කළ යුතු ය.**" යන්න ලිපියෙහි දක්වා තිබේ. මෙම ව්‍යවස්ථාපිත කරුණු අනුව ආරාම කළමනාකරණයට ගිහි පාර්ශ්වය දායකත්වය දැක්වුව ද ඔවුන් ද නීතිමය රාමුවක් තුළින් පාලනය කිරීම තුළ විහාරසන්තක දේපල අඛණ්ඩ ආරක්ෂණ ක්‍රියා පටිපාටිය රාජ්‍ය විසින් නතු කර ඇති ආකාරය හඳුනා ගත හැකි ය.

**පර්යේෂණ නිගමනය**

ක්‍රි.පු. 3 වන සියවස තුළ මෙරට ප්‍රචලිත වූ බුද්ධාගම සමකාලීන සමාජය තුළ ව්‍යාප්ත වීම හා එය බෞද්ධ පිරිස් විසින් පෝෂණය කිරීම තුළ එය ස්ථිර ආගමක් ලෙස මෙරට මුල්බැස ගන්නා ලදී. රාජ්‍ය අනුග්‍රහය නො මඳ ව ලැබීම, සමාජ ප්‍රභූන් හා සිවුවනක් පිරිසගේ දායකත්වයෙන් ආරාමික දේපල වර්ධනය වීම භික්ෂුව සමාජතලය තුළ ප්‍රබලත්වයක් ඉසිලීමට හේතු විය. මෙම තත්ත්වයන් වර්ධනය වීම මත අගතිගාමී ප්‍රතිපත්ති ක්‍රියාවන් බුද්ධාගම තුළ වර්ධනය වීම මත එම තත්ත්වයන් මැඩලීමට සමකාලීන දේශපාලන බල යාන්ත්‍රනයේ මැදිහත් වීම සහ ගිහි පාර්ශ්වයේ මැදිහත් වීම සිදු වූ ආකාරය අපට ඉහත පර්යේෂණය තුළින් පෙන්වා දීමට පුළුවන. ආරාමික කළමනාකරණ කාර්යයන් සඳහා භික්ෂුව විසින් ගිහි දායකත්වය අපේක්ෂා නො කළ ද භික්ෂුවගේ කාර්යයන් හා බලතල භාවිත කිරීමේ අගතිගාමී දිශානතිය අකැප වීම තුළින් ඔවුන් දුශ්ශීලභාවයට යොමු වීම වළක්වාලීමට ඉහත සඳහන් ගිහි දායක්ත්වය තුළින් භික්ෂූන්ගේ කාර්යයන් නීතිරීති ව්‍යවස්ථාපිත ගත කොට නියාමනය කොට එය රාජ්‍ය ක්‍රියාවලියට නතු කිරීම සිදු වී තිබෙන ආකාරය මෙම ව්‍යවස්ථාව තුළින් අධ්‍යයනය කළ හැකි ය.

**ප්‍රමුඛ පදඃ** මිහින්තලය, පුවරුලිපිය, ආරාමික කළමනාකරණය, භික්ෂුව, දායකත්වය

**මූලාශ්‍රය**


- අමරවංශ හිමි, කේ. (2014). **ලක්දිව සෙල්ලිපි.** වැල්ලම්පිටියඃ චතුර මුද්‍රණාලය.
- අඹන්වල, සී.බී. සහ සමරනායක, ජී. (2018). **හෙළබොදු හැදියාවේ බිහිදොර මිහින්තලාව.** මහනුවරඃ බුවනෙක ප්‍රකාශකයෝ.
- ලගමුව, ඒ. (2009). **මිහින්තලේ සෙල්ලිපි.** මිහින්තලේඃ කර්තෘ ප්‍රකාශන.